වාවකච්චේරිය නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය.

--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 22 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 19 සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්න වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා

----------------------------

i. මූල්‍ය ප්‍රකාශන වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ ඌනතා ආදායම් හා බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | <u>ආදායම්</u> | | <u>බැරකම්</u> | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | 01 | 16,500 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 90,188 | - | - |
| අත්හැරීම් | - | - | 01 | 986,856 |

ii. සභාවට ත්‍යාග වශයෙන් ලබාගත් යතුරු පැදි වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි. ඒ අනුව ස්ථාවර වත්කම් වටිනාකම ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 උපයෝජනය නොකළ සංචිත
-------------------------------------

වසර 5 අධික කාලයක් තිස්සේ රු.1,437,046 ක් වූ පොදු සංචිත දිගින් දිගටම ගිනුම් වල පෙන්වා තිබුනි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්
-------------------------------

ප්‍රධාන ලෙජරයට අනුව, ගිණුම් විෂයයන් තුනකට අදාල රු.33,034,723 ක මුදල, රු.33,284,043 ක් ලෙස උපයෝගි ලේඛන වල දක්වා තිබිම හේතුකොට ගෙන රු.249,320 ක වෙනසක් උද්ගතව තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
---------------------------------------------

තොරතුරු ඉදිරිපත් නොකිරිම
-----------------------------------

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු නොමැතිකම නිසා රු.30,781,181 ක් වූ ගණුදෙනු විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------------

2.1 ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,330,132 ක් වූ අතර එයට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,043,728 ක් විය.

2.2 මුල්‍ය පාලනය
------------------

අයවැය විධිමත්ව සකසා නොතිබුණි. එනිසා අයවැයගත හා තත්‍ය ආදායම අතර රු.22,935,835 වෙනසක් ද අයවැයගත හා තත්‍ය වියදම අතර රු.13,052,150 ක් ද වූ වෙනස්කම් පැවති බැව් විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය
-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම්
--------------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම් සහ හිඟ අදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ ආදායම් |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| i. | වරිපනම් හා බදු | 1,351 | 6,397 | 7,812 |
| ii. | බදු කුලී | 16,651 | 17,807 | - |
| iii. | බලපත්‍ර ගාස්තු | 4,245 | 3,317 | - |
| iv. | වෙනත් ආදායම් | 56,658 | 27,847 | 32,408 |

### 2.3.2 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා එකතුව රු.7,811,563 ක් වූ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා සභාව විසින් නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියා පිළිවෙලක් ගෙන නොතිබුණි.

### 2.3.3 උසාවි දඩ

සමාලෝචිත වර්ෂය සඳහා වාවකච්චේරිය මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබිය යුතු රු.1,235,349 ක් වූ දඩ මුදල් ආදායම් වශයෙන් හෝ ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3.4 මුද්දර ගාස්තු

i. ආදායම් හා ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම්ගත කර තිබූ 2006, 2007, 2010, 2011 සහ 2012 සඳහා ලැබිය යුතු රු.31,073,207 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා ඵලදායි ක්‍රියා පිළිවෙලක් ගෙන නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.10,734,600 ක මුද්දර ගාස්තු ලැයිස්තුවක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගෙන තිබුණි. එනමුත් එය ආදායම් වශයෙන් හෝ ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 2.4 කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම

මියගිය/සේවය අත්හිටුවනු ලැබූ සේවකයන් ගෙන් අයවිය යුතු රු.121,946 සේවක ණය හිඟ මුදල් ඔවුන්ගෙන් පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා අවුරුදු 5 කට අධික කාලයක් තුලදි නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියා පිළිවෙලක් ගෙන නොතිබුණි.

### 2.5 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා

අයිතම 274 ක අතිරික්තයක් හා අයිතම 67 ක ඌනතාවයක් සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්නුම් කර තිබුණි.

2.6 වත්කම් කළමනාකරණය

--------------------------------

වාහන උපයෝජනය

------------------------

i. සමාලෝචිත ව තුලදි සභාවට අයත් වාහන හතරක් නිෂ්කාර්යව තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය තුලදි අංක එන්පිජීකේ 0761 දරන හයිඒස් රථය අනතුරකට ලක් වි එය අළුත්වැඩියා කිරිම සඳහා රු.284,033 ක් වැයකර තිබුණි. එනමුත් අනතුර සම්බන්ධ විස්තර විගණනයට දන්වා නොතිබුණි.

2.7 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා රු.1,928,850 ක ප්‍රාග්ධන ව්‍යාපෘති 19 ක් අයවැය මගින් අනුමත කර තිබුණි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබු අතර ඒවා විවිධ ණයගැති ගිණුමේ ඇතුලත් කර තිබුණි.

2.8 අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පිළිසරු ව්‍යාපෘතය යටතේ සභා අරමුදල් ද යොදාගෙන රු.3,522,684 ක පිරිවැයකින් සමාලෝචිත වර්ෂය තුලදි අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබුණි. එනමුත් දිගින් දිගටම අපද්‍රව්‍ය පිළිස්සීම සිදුකර තිබු අතර, සීමා දක්වමින් ඒවා එකතු කිරිමේ ක්‍රියා පිළිවෙලක් අනුගමනය කර නොතිබුනි. අපද්‍රව්‍ය වලින් පිරුනු අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය නිෂ්ක්‍රීයව පැවතිණි.

2.9 අභ්‍යන්තර විගණනය

--------------------------

ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, සිව් මාසික අභ්‍යන්තර විගණන වැඩසටහනක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරිම

(ආ) විවිධ තැන්පතු

(ඇ) අයවැය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) ගිණුම්කරණය